# ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය 2010 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම යෝජනා ක්‍රමය 2021.08.06 දිනැති 2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි මගින් පාලනය වේ. (www.cbsl.gov.lk වෙතින් බාගත කළ හැක)

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාර යෝජනා ක්‍රමයෙහි සාමාජික ආයතන වන්නේ;

1. සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු
2. සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු
3. සියලුම බලපත්‍රලාභී මූල්‍ය සමාගම්

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි සාමාජික ආයතනයකට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කළ අවස්ථාවකදී, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි සාමාජික ආයතනවල රක්ෂිත තැන්පතුකරුවන්ට රු.1,100,000 ක උපරිමයක් දක්වා හෝ විදේශ මුදල් තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මුදලින් රු.1,100,000 කට සමාන මුදල් ප්‍රමාණයක උපරිමයකට යටත්ව, එක් ආයතනයක එක් තැන්පතුකරුවෙකු සඳහා යන පදනම මත හානි පූර්ණය කරනු ලබයි.

ඒකාබද්ධ තැන්පතු සම්බන්ධයෙන්, සෑම හවුල් තැන්පතුකරුවෙකුම තනි තැන්පතුකරුවෙකු ලෙස සලකා, ඔහුට/ඇයට රුපියල් 1,100,000 ක උපරිමයක් දක්වා හානි පූර්ණ මුදල් ගෙවනු ලැබේ.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතනවල යාවත්කාලීන කරන ලද ලැයිස්තු ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකියි.

කරුණාකාර QR කේතය ස්කෑන් කරන්න, නැතහොත් යාවත්කාලීන කළ සාමාජික ආයතන ලැයිස්තු සඳහා පහත සබැඳිය භාවිතා කරන්න.

**1. සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු**

https://www.cbsl.gov.lk/authorized-financial-institutions/licensed-commercial-banks

**2. සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු**

https://www.cbsl.gov.lk/authorized-financial-institutions/licensed-specialised-banks

**3. සියලුම බලපත්‍රලාභී මූල්‍ය සමාගම්**

https://www.cbsl.gov.lk/authorized-financial-institutions/licensed-finance-companies

**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

(Hotline) 1935 / +94 11 247 7966